අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

| | | | |
|---|---|---|---|
| සිංහල II<br>சிங்களம் II<br>Sinhala II | 71 S II | | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

විභාග අංකය

උපදෙස්:

- I කොටසේ 1 ප්‍රශ්නය ද, II කොටසේ 2, 3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- 1 ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- I කොටස, II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

1. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන, එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

1.1. 'සඤ්ඤක්ෂර' අන්තර්ගත වරණය තෝරන්න.
(1) අ, ආ, ඇ, ඈ (2) ආ, ට, ඌ, රී, ම (3) ඝ, ඥ, ඤ, ඥ (4) ඒ, ඓ, ඕ, ඖ (5) ෆ, ෆ, ළ, ළු (......)

1.2. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
(1) අරුණළු, කළණ, කාළතෝල, දැඹිසලු, පිළිසරණ
(2) අරුණළු, කලණ, කාලතෝල, දැඹිසළු, පිළිසරණ
(3) අරුණලු, කලණ, කාළතෝල, දැඹිසලු, පිළිසරණ
(4) අරුණලු, කළණ, කාලතෝල, දැඹිසළු, පිළිසරන
(5) අරුණළු, කලන, කාළතෝල, දැඹිසලු, පිළිසරන (......)

1.3. අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.
(1) ගුරුළුගෝමි, වැත්තෑවේ, විද්‍යාචක්‍රවර්ති, ධර්මසේන
(2) බුද්ධපුත්‍ර, පැරකුම්බා, පරාක්‍රම පණ්ඩිත, අලගියවන්න
(3) මෛත්‍රේය, රාහුල, මිහිරිපැන්නේ, සමිත් තෙරිඳා
(4) සරණංකර, පස්නායාම් ලේකම්, ධර්මානන්ද, සංඝරාජ
(5) අනවමදර්ශී, කුමාරදාස, ධර්මාරාම, වේදේහ (......)

1.4. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) 'යංශය' යනු 'ය' සන්ත වෙනුවට යෙදෙන අක්ෂර සංකේතයකි.
(2) 'යංශය' 'ර' කාරයෙන් පසු ද යෙදේ.
(3) 'යංශය'ට පෙර යෙදෙන ව්‍යඤ්ජනය හල් ලකුණ සහිත ව යෙදේ.
(4) අන්‍ය ව්‍යඤ්ජනවලට මෙන් සුදකලා යංශයට ද සියලු පිල්ලම් එක් කළ හැකි ය.
(5) අනුස්වාරයට පූර්වයෙන් යංශය භාවිත කළ හැකි ය. (......)

1.5. රේඵය, රකාරාංශය, යංශය හා යෙදුම්ලත සහිත වචන අනුපිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) මාර්ගය, මහෞෂධ, පවණ, උපක්‍රම
(2) ප්‍රකාශ, චෛතන්‍යයසින, සකවිත, අමාත්‍යාංශය
(3) ගර්ජ, ප්‍රබුද්ධ, අව්‍යය, ශෝචිත
(4) සාර්ථක, භූශී, ගෞරවාර්ථ, ශ්‍රෝත්‍රාංශ
(5) ප්‍රහර්ෂ, මූර්ජ, මාන්‍යකය, පෞතෙවිස්ත්‍ය (......)

1.6. එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.
(1) මාර්ග නීති, මෞලි මංගලය, රණවිරු උපහාර, සමිතර ප්‍රශ්න
(2) වෛද්‍ය විද්‍යාලය, පෙර අහිර, ප්‍රවාහන අංශය, මහී ජනතාව
(3) පාසල් අධ්‍යාපනය, ලාංකික අනන්‍යතාව, සාහිත්‍ය මණ්ඩපය, පවුල් සාගතය
(4) පෙම්හල් මන්දිරය, වනවාසී ජීවිතය, මදුරු මර්දනය, මානව හිතවාදී
(5) මාසේ උපහාර, ආචාර්ය මණ්ඩලය, ලක් දෙරණ, සිරිය අදියර (......)

1.7. පර්යාය වචන පමණක් යෙදී ඇති වරණය කුමක් ද?
(1) පාලක, වල, පණ, ප්‍රදාන
(2) ආකල්ප, විකල්ප, සංකල්ප, කල්ප
(3) ප්‍රමාණ, විමාන, ප්‍රමුඛ, සමාන
(4) වන්දන, වන්දනා, සැන්දන, චින්දන
(5) පරිසර, නිරසර, පරිවාර, සුකුමාර (......)

1.8. මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් නො දෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) සත්පුරුෂ - අසත්පුරුෂ, දුර්ජන, අසජ්ජන, අදමිට
(2) උච්ච - පහත්, නීච, අධම, උසස්
(3) දක්ෂ - අශාන්ත, නොදක්ෂ, අසංවර, අදාන්ත
(4) දුර්ලභ - සුලභ, බහුල, අධික, බොහෝ
(5) විද්වත් - අඥාන, මෝඩ, මූර්ඛ, අවිද්වත් (......)

[දෙවැනි පිටුව බලන්න.

1.9. මුළින් දී ඇති පදයට **සමානාර්ථ පදයක් ඇතුළත් නො වන** වරණය තෝරන්න.
(1) ස්වර්ණ - රත්රන්, කනක, හේම, රුවන්
(2) කූටය - මුදුන, අග්‍රය, කුළු, මස්තකය
(3) කුරුල්ලා - විහග, පක්ෂියා, ද්විජ, දද
(4) මුහුද - ජලනිධි, සමුද්‍ර, අර්ණව, සිඳු
(5) ස්නේහ - පෙම්වත්, ආලවන්ත, ආදරණීය, ලෙන්ගතු (......)

1.10. **විශේෂණ පූර්ව පද, උපමාන පූර්ව පද, විශේෂණ අපර පද** හා **උපමාන අපර පද** යන **විශේෂණ සමාස** පද **පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
(1) පැරකුම්රජ, සුදුමල, සසරකතර, සිතරතන
(2) සිතරතන, සසරකතර, සුදුමල, පැරකුම්රජ
(3) සුදුමල, පැරකුම්රජ, සිතරතන, සසරකතර
(4) සුදුමල, සිතරතන, පැරකුම්රජ, සසරකතර
(5) සසරකතර, පැරකුම්රජ, සිතරතන, සුදුමල (......)

1.11. **කෘදන්තයක් නො වන පදයක් අන්තර්ගත** වරණය තෝරන්න.
(1) මැරූ, දැරූ, පැරූ, වැරූ
(2) පිසින, දුසින, හසින, බසින
(3) වැස්ස, මැස්ස, බැස්ස, හැස්ස
(4) පැවරීම, ඇසිරීම, හැසිරීම, වැසිරීම
(5) ඇල්ල, ඉල්ල, සෙල්ල, එල්ල (......)

1.12. පහත සඳහන් උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද **අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
(අ) "**කාලා** රසමුසු බොජ්න කර පෙම්"
(ආ) "**හමිමි** අග පළුරු පෙර හියමින්"
(ඉ) "... පෙළෙ **දිදී** විදුලිය පමා"
(ඊ) "ඔවා **දෙනු** පරතට"
(1) පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා, අනුකාලිකක්‍රියා, විධික්‍රියා
(2) අනුකාලිකක්‍රියා, මිශ්‍රක්‍රියා, විධික්‍රියා, පූර්වක්‍රියා
(3) මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා, අනුකාලිකක්‍රියා, විධික්‍රියා
(4) පූර්වක්‍රියා, අනුකාලිකක්‍රියා, මිශ්‍රක්‍රියා, විධික්‍රියා,
(5) විධික්‍රියා, අනුකාලිකක්‍රියා, මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා (......)

1.13. **උක්ත පද දෙකක්** හා **අනුක්ත පද දෙකක්** අන්තර්ගත වරණය තෝරන්න.
(1) බැතිමතෙක්, ඇතින්නක, මිත්තණියන්, පෙර
(2) කවුසතු, හීසිදයතු, හදගෙයින්, කයින්
(3) උයරෙර්, මීයෝ, බමුණෝ, බිරියන්
(4) යසතු, පොහ, සුරිඳු, සිඟන්නන්
(5) පෙසරතු, පොරතු, බිහිරතු, අන්ධයෙක් (......)

1.14. **උපසර්ගයක් යෙදී නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) අවවාද, අවජාත, අවගුණ, අවමාන
(2) සම්භාෂණ, සන්තාප, සංවේදන, සම්මාන
(3) පිරිසිදු, පිරිපුන්, පිරිසිඳ, පිරිහුණු
(4) සුසර, සුසිදු, සුසිනිදු, සුරතුරු
(5) දුර්ලභ, දුහද, දුසිරිත්, දුෂ්කර (......)

1.15. "ආලයෙන් වෙලි **සැදී** මෙ **ලකාමිත්ත්‍රවිරයන් වන්නාසා** ධන්වින වේ හිරුරජිඳුගෙ" යන උද්ධෘතයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන්** ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංශවලට ද?
(1) සන්ධි, කෘදන්ත හා සමාස
(2) සමාස, කෘදන්ත හා සන්ධි
(3) කෘදන්ත, සන්ධි හා සමාස
(4) සන්ධි, සමාස හා කෘදන්ත
(5) කෘදන්ත, සමාස හා සන්ධි (......)

1.16. **ව්‍යාකරණානුකූල ව නොගැළපෙන** පදයක් ඇති වරණය කුමක් ද?
(1) දේවාලය, හිමාලය, ජනාලය, විද්‍යාලය
(2) ලට්ට-ලොට්ට, වං-හුං, ලව්ස්-දෙව්ස්, තත්තු-මුත්තු
(3) කවදොර, කුන්ලේ, පස්විපුම්, දසදෙස
(4) මාධ්‍යනා, සෞඛ්‍යය, සෞම්‍ය, සෞන්දර්ය
(5) වැදිලි, විදිලි, බැදිලි, සිදිලි (......)

1.17. **සමාසයක් නො වන පදයක් ඇතුළත්** වරණය තෝරන්න.
(1) දිවිගුරු, සසරකතර, හදවිල, ජීවනාදසුම
(2) නිකඩ, නිමල, නිපුණ, නිවරද
(3) නිල්දිය, සුදුමුණු, රතුපලස, කළුතැල්ලම
(4) රජගෙදර, සාගසාරාමය, මලුසුදුව, ළමාසමිතිය
(5) කුන්දොස්, සෙබඩුල, අටලෝදනම, පසිඳුරන් (......)

1.18. **එක ම වර්ගයට අයත් සන්ධි පද** අන්තර්ගත වරණය තෝරන්න.
(1) ගොළුව, ඉවහත, මුවග, සිරග
(2) ධූලේද්‍ර, සහෝදර, පයෝධර, යශෝධර
(3) කොත්තොළ, ලිහිමාත්ත, දස්සන, කම්මල
(4) සම්මන්ත්‍රණ, සානුනාසික, සානුකම්පිත, සමලංකෘත
(5) අංවිඩැ, දුහිලි, ඇන, දැහැව (......)

1.19. ව්‍යාකරණානුකූල ව **නිවැරදි වැකිය** තෝරන්න.
(1) මේ පාසලෙහි ශිෂ්‍යයන් නැත.
(2) සියලු සිංහලයෝ බෞද්ධයෝ නො වෙති.
(3) මේ ගමෙහි දෙවි කෙනෙක් වැනි මිනිසෙක් වෙසෙයි.
(4) දරුවා ද මම ද මිනිස්සු ද ගමට යති.
(5) වලා පෙළ අහසේ පා වෙති. (......)

1.20. **වඩාත් ම නිවැරදි පද බෙදීම** සහිත වාක්‍යය තෝරන්න.
(1) ගුණවන්තයැයි කියූ දරුවෝ දෙමාපියන් බැලීමටවත් නොපැමිණියහ.
(2) සුභාවිත ගීත කලාව වූ කලී රචනයේ ත් වාදනයේ ත් ගායනයේ ත් සුසංයෝග ය යි.
(3) විද්‍යාල්පතිතුමාද විද්‍යාල්පතිතුමියද දරුවන් ගේ අභිවෘද්ධි ය පිණිස වැඩ කරන්නා හ.
(4) ක්‍රීඩාභූමියේ දී දක්ෂතාව මෙන් ම සංයමය ද අතිශයින් වැදගත් ය.
(5) ගුණගරුකව ජීවත් වන්නෝ නිහඬ තාව අගය කරති. (......)

(ලකුණු 20 යි.)

[තුන්වැනි පිටුව බලන්න

 03760

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

| | | | |
|---|---|---|---|
| සිංහල | I | 71 S I | පැය තුනයි |
| சிங்களம் | I | | மூன்று மணித்தியாலம் |
| Sinhala | I | | Three hours |

**උපදෙස්:**

※ **පළමුවැනි** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

※ පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.

- පහත දැක්වෙන උද්ධෘත පාඨ කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. (අ) පෙරාතු දවසක දී සිටාණෝ රජගෙට ගොසින් එන තෙනැත්තෝ එක් සාකුස් ඇති දනවු මිනිසකු කුම්මාසයන් පිරුණු කබලුපූවක් කන්නවුන් දැක සම්පත් මහත් වුවත් අදහස කුඩා හෙයින් ඒ කබලුපූවෙහි රුචියක් ඇතිව ගෙන තමන්ගේ ගෙට ගොසින් 'ඉදින් කබලුපූවක් කනු කැමැත්තෙමි කීම් නම් මා කැමති වූවා සේ ම බොහෝ දෙනත් කන්ට සිතා ගනිති. එසේ කලට මාගෙන් බොහෝ සාල් හා කිරි පැණි සකුරු ආදී වූ බොහෝ දෙයට අළුවි පෙනෙයි. කිසි කෙනකුන්ටත් නොකියමි'යි සම්පත් ඇති නියාව කාටත් නොහඟවන්නා සේ ම කබලුපූවට කළ ආලයත් සිටුදුවණියන් පමණකටත් නොහඟවති. නොහැඟවීමෙන් කල් යත් යත් කසායුස වත් කොට පිසූ කබලුපූ සේ පඬුවන් පැහැ ඇති විය. නොතර මාලුකඩෙක වැල් පැදලූ කලක් මෙන් ඇඟ නහරවැලුත් ඉපිළ ගියේ ය.

   (i) සිටාණන්ට කබලුපූවෙහි රුචියක් ඇති වූයේ ඇයි?

   (ii) සිටුතුමා කබලුපූවක් කනු කැමති බව කාහටවත් නො පැවසූයේ ඇයි?

   (iii) කල්යාමේ දී සිටාණන්ගේ සිරුර කිනම් පැහැයක් ගත්තේ දැයි පහදා දෙන්න.

   (iv) **"නොතර මාලුකඩෙක වැල් පැදලූ කලක් මෙන්"** යන්නෙහි අර්ථය පහදන්න. (ලකුණු 04 යි.)

   (ආ) බෝධිසත්වයෝ ඒ චන්ද්‍ර කුමාරයනුත් කල් යවා නොඑන හෙයින් "එක්තරා අන්තරායෙක් විය යුතු ය"යි තුමූ එතනට ගොස් දෙදෙනා ම විලට බට පියවර සටහන් දැක "මේ විල රාක්ෂසයකු අධිගෘහිත විලක් වුව මැනවැ"යි සිතා කඩුව උරයේ එල්වා ගෙන දුන්න නගා දුනු මිට හිය ලා ගෙන සිටියාහු ය. දිය රකුසු බෝධිසත්වයන් දියට නොබස්නා දැක වල දඬු කපා ඇවිදිනා පුරුෂයකු මෙන් තමාගේ ස්වරූපය පාලා බෝධිසත්වයන්ට කියන්නේ "පින්වත් වූ පුරුෂය, තොපි මග ගමන් යාමෙන් මිරිකී ගියව, කුමක් හෙයින් මේ විලට බැස නා පියා පැන් බී නෙළුඹල හා නෙළුඹුදැලි කා මල් පැළඳ සැප සේ නො යවු දැ"යි කිවූ ය.

   (i) බෝධිසත්වයන් තම සොහොයුරන්ට වූ අනතුර දැනගත්තේ කෙසේ ද?

   (ii) දියට නොබසින බෝධිසත්වයන් ඉදිරියෙහි දිය රකුසා කිනම් ස්වරූපයකින් පෙනී සිටියේ ද?

   (iii) බෝධිසත්වයෝ විල අසල කිනම් ආකාරයකින් සිටියාහු ද? යන්න විස්තර කරන්න.

   (iv) **'කල් යවා නොඑන හෙයින්'** හා **'මග ගමන් යාමෙන් මිරිකී ගියව'** යන පාඨවල අර්ථ ලියන්න. (ලකුණු 04 යි.)

   (ඉ) එතැන් පටන් කම්මාරතිස්සයෝ දානාදී වූ පින්කම් කෙරෙමිනි ආයු කෙළවර එයින් මිය අනුරාධපුර නුවර දුටුගැමුණු රජ්ජුරුවන්ට පුත් ව උපන්හ. ඔවුන් මව්කුසින් බිහිවීම හා සමග සියලු ලංකාද්වීපයෙහි එකපැහැර සුවඳ රත්හැල් වර්ෂ කළේ ය. යටත් පිරිසෙයින් උදුනෙහි තබන ලද තණසාල් ආදී බතුදු පෙරළී සුවඳ හැල්සාලේ බත් ම විය. තණ වරා ආදී වූ කටුසර පිරූ කොටුගුලු සුවඳ හැලින් පිරිණ. වී නැති සිස් කොටුගුලු ද එපරිද්දෙන් ම හැලින් පිරුණේ ය. උදක් ඔවුන් උපන් දවස මතු නොවෙයි. ඒ කුමාරයන්ට තුන්මසින් සත්මසින් නවමසින් කළ මනා ඒ ඒ මගුල් දිනයෙහි ද බත් කැවීම්, කන්විදීම්, යුවරජ තැන් ලැබීම් ආදී වූ ඒ ඒ මගුල් දිනයෙහි ද මුළු ලක්දිව එක පැහැර ඇල් වැසි වැස පිරී ගිය, තණ වරා ආදී වූ ශස්‍යජාතිහු ද පෙරළී ශාලි ජාති ම වූහ. මෙසේ ඒ රාජකුමාරයන් නොයෙක් ආශ්චර්ය ලොව පහළ කෙරෙමින් ශාලිබන්ධු ව උපන් හෙයින් ඔවුන්ට ශාලි කුමාර ය යි නම් තුබූහ.

   (i) කම්මාරතිස්සට තමන් විසින් කරන ලද පුණ්‍යකර්මවල විපාක ලැබුණේ කෙසේ ද?

   (ii) ඔහු මව්කුසින් බිහිවීමත් සමග සිදු වූ ආශ්චර්ය කුමක් ද?

   (iii) රාජ කුමාරයා ශාලි කුමාර යැයි ප්‍රසිද්ධ වූයේ කවර හෙයින් ද?

   (iv) **'කටුසර'** හා **'කොටුගුලු'** යන වචනවල අරුත් පහදන්න. (ලකුණු 04 යි.)

[දෙවැනි පිටුව බලන්න.

(ඊ) මහත සසර සයුරෙහි කුමුටුව    සරන
අනත සත නිවන් පුර ගෙන යන    සිතින
සතත සොඳුරු බුදුකුරු ගුණ දම්    පුරන
දියත පසිඳු නතිඳුන් දැක ගොස්    සොබන

පව   ර   රුසිරු මහ සෑ සමග බෝ    තුරු
තොහැ   ර   නැමැද බැති පෙම් සිතිනි    විසිතුරු
වෙහෙ   ර   පුද පසඟ තුරු රැව් නොදෙන    තුරු
මිතු   ර   තොසින් වැද සැදි සොඳුරු    පහතුරු

(i) නාථ දෙවිඳු බුදුකුරු ගුණදම් පුරන්නේ කුමක් සඳහා ද?
(ii) 'සසර සයුරෙහි' යන්නෙහි කාව්‍යාලංකාරය නම් කරන්න.
(iii) ගිරවාට මහසෑය සහ බෝරුක නමදින්නට කීවේ කවර ආකාරයට ද?
(iv) '**පුද පසග තුරු රැව්**' යන්නෙහි අර්ථය ලියන්න. (ලකුණු 04 යි

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.
(i) "නුවණැත්තවුන් විසින් ශීලවිශුද්ධිය කොට ගෙන තමතමන්ට පිහිට විය යුතු ය."
(ii) "සියලු වැව් පොකුණු හෝ කඳුරැලි ආදිය ප්‍රසන්න ජලයෙන් පිරී සිටිනේ ය."
(iii) "එසේ හෙයින් නැවත ගිහිගෙය විසිය නො හෙමි."
(iv) "ඕක පරෙස්සමෙන් තියාගන්න. හරි වටින දෙයක්."
(v) "යකෙක්, යකෙක්, මේ මූණමල් ගහේ යකෙක් ඉන්නවා."
(vi) "හාමු මං ගිහින් එන්නම්. හාල් තුනපහ ගන්ඩ කඩේ යන්ඩත් තියෙනවා" (ලකුණු 08 යි

(ඌ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

අට වයස් නොදරුවා
හැට පිරුනු කලු සමින්
වැසුනු ඇටසැකිල්ලකි

එහෙත් ඔහු සිනා සෙයි
දත් පුරා සිනාසෙයි
කට පුරා සිනාසෙයි

ඇට පෙනෙන මුහුන මත
දෙකන තෙක් දිග් ගැහුනු
සිනාවෙන් ඔහු මුහුන
පුරුදු නැති සිත්තරෙකු
නොංචි කෝලමට කැපූ
සරිය වෙස් මුහුනකට

වමත පොල් කටුවෙ සිට
කට ලඟට ගොස් වැටෙන
ලී කැබැල්ලකි සුරත

බට්ටෙක් මෙන් ඔරලෝසුවෙ
ගනන් බලා තුන් විඩයක්
උඩහට පහලට ගිය අත
හිස් පොල් කටුවේ
එකවර නැවතින

"පොඩි ළමයෝ
බත්
ඉවර ද කාලා"

පුදුමයෙන් මෙන් බලා මා දෙස
දෙකන තෙක් දික් සිනා පාලා
විසිකොට පොල් කටුව කානුවේ
පිස දමයි අත ඉරුනු සරමේ

(ලකුණු 16 යි.)

2. "කථාවස්තු ප්‍රබන්ධයේ දී සද්ධර්මරත්නාවලී කතුවරයා ධර්ම දේශනා ශෛලිය, උසස් ගද්‍ය රීතියකට සරිලන පරිදි සකසා ගත්තේ ය." නියමිත කථා වස්තු ඇසුරෙන් මේ අදහස විමසන්න. (ලකුණු 15 යි.)

**නැතහොත්**

ලේඛකයාගේ විවරණයට හසුවන කථාවස්තුවල චරිත විග්‍රහය සදාතනික අගයකින් යුක්ත වන ආකාරය නියමිත ජාතක කතා **දෙකක්** ඇසුරෙන් පහදන්න. (ලකුණු 15 යි.)

3. "සමාජයක මුල් බැස ඇති ආචීර්ණකල්පිත ආකල්ප කෙරෙහි සද්ධර්මාලංකාර කතුවරයාගේ දෘෂ්ටිය කිනම් ස්වරූපයකින් යුක්ත වී දැයි" නියමිත කථාවස්තු ආශ්‍රයෙන් විමර්ශනයක යෙදෙන්න. (ලකුණු 15 යි.)

4. වර්ණනාවල විවිධත්වයට අනුරූප වන ලෙසට උචිත කාව්‍යෝක්ති නිර්මාණයෙහි ලා ගිරා සන්දේශ කතුවරයා, දක්වන සාමර්ථ්‍යය වර්ණනා **තුනක් වත්** ආශ්‍රය කොට ගෙන සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

5. "සාර්ථක චරිත හා සිද්ධි නිරූපණය උදෙසා ජපානයේ පරිසරය හා සමාජ සංස්කෘතික පසුබිම කතුවරයාට ඉවහල් විය." 'මළ ගිය ඇත්තෝ' නවකතාව ඇසුරෙන් විභාග කරන්න. (ලකුණු 15 යි.)

6. කුටුම්බ ජීවිතයෙහි සංකීර්ණ ස්වභාවය ප්‍රතිනිර්මාණයෙහි ලා නූතන කෙටිකතාකරුවන් උත්සුක වී ඇති ආකාරය නියමිත කෙටිකතා **තුනක් වත්** ආශ්‍රය කොට ගෙන සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

7. පුද්ගල හා සමාජ අත්දැකීම් නිරූපණයෙහි ලා නූතන කවීන් ප්‍රකට කළ මානව හිතවාදී දෘෂ්ටිය නියමිත පද්‍ය පන්ති **තුනක් වත්** නිදසුන් කොට දක්වමින් පහදන්න. (ලකුණු 15 යි.)

8. නාට්‍යෝචිත අවස්ථා ගොඩනගමින් නාට්‍ය විකාශනයෙහි ලා උදයන රජුගේ චරිතය ඉවහල් වී ඇති ආකාරය රත්නාවලී නාට්‍ය පෙළ ඇසුරෙන් උදාහරණ සහිත ව සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

## II කොටස

2. (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සංස්කෘතික පරිසර විද්‍යාව නම් සංකල්පය පුරාවිද්‍යා ශික්ෂණයට පමණක් සීමා වූවක් නොවේ. එය දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව ආදී පුළුල් පරාසයක දිවෙන වෙනත් සමාජයීය හා මානව ශාස්ත්‍ර විෂයක්ෂේත්‍රයන් සමග ද බැඳී පවතී. සංස්කෘතික පරිසර විද්‍යාවේ දී වඩාත් අවධානයට යොමු කෙරෙන්නේ අර්ථකථනාත්මක පුරාවිද්‍යාවේ ප්‍රධාන න්‍යායාත්මක සංකල්පයක් ලෙස සැලකෙන පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව නම් විෂය පිළිබඳ ව ය. පසුකාලීන ව සංස්කෘතික පරිසර විද්‍යාව නම් විෂය සඳහා ක්‍රමික පදනම සැකසී ඇත්තේ දහනවවන සියවසේ සිට පමණ ය. එතෙක් පැවති දේවනිර්මාණවාදී අදහස් බිඳ දමමින් චාර්ල්ස් ඩාවින්, තෝමස් හක්ස්ලි ආදීන් ජීවවිද්‍යාත්මක පරිණාමයක් හැඩි නම් අනුවර්තීය යාන්ත්‍රණයක් පිළිබඳ ව දැක්වූ අදහස් ද කාල් මාක්ස්, ෆ්‍රෙඩ්රික් එංගල්ස් වැන්නන් සමාජ පරිණාමය පිළිබඳ ව දැක්වූ අදහස් ද මේ සඳහා මූල බීජ සපයා ඇත. බටහිර චින්තනය තුළ ඇති වූ අනුවර්තීය දාර්ශනික පරිණාමය බොහෝ ශික්ෂණයන්හි ගමන් මාර්ගය තීරණාත්මක ලෙස වෙනස් කිරීමට සමත් විය. පරිණාමවාදය, ව්‍යුහවාදය, නූතනවාදය හා පශ්චාද්නූතනවාදය මෙහි ලා ප්‍රධාන ගාමක බලවේග වශයෙන් විශාල මෙහෙයක් ඉටු කළ බව හඳුනාගත හැකි ය. මෙම සංකල්පවල බලපෑම පුරාවිද්‍යා ශික්ෂණය කෙරෙහි ද විවිධාකාර න්‍යායාත්මක පෙළඹීම් එක් සේ සම්ප්‍රේෂණය වීම වර්ෂ 1960 පමණ සිට නව පුරාවිද්‍යාව නැතහොත් සංස්ලේෂී පුරාවිද්‍යාව නම් න්‍යායාත්මක සංකල්පයක් පුරාවිද්‍යා ශික්ෂණය තුළ වර්ධනය වීමෙන් පැහැදිලි වෙයි. ඉන් අනතුරුව විශේෂයෙන් පශ්චාද්නූතනවාදයේ ආභාසයෙන් පශ්චාත් සංස්ලේෂී පුරාවිද්‍යාව නම් සංකල්පයක් වර්ෂ 1970 පමණ සිට බටහිර [illegible] පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාවේ දියුණුව හා එහි භූමිකාවේ ස්වරූපය කෙරෙහි තීරණාත්මක බලපෑම් ඇති කළ ඒවා ය. පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව අවබෝධ කර ගැනීමට නම් මූලික වශයෙන් ම මිනිසා සහ පරිසරය අතර පැවති අන්‍යෝන්‍ය සම්බන්ධතාවේ ස්වරූපය හඳුනාගත යුතු ය. මානව ක්‍රියාකාරකම් පරිසරය මත පුළුල් පරාසයක් පුරා ව්‍යාප්ත වන ස්වරූපයේ වෙනස්කම් ඇති කිරීමට සමත් ය. පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව තත්ත්වාකාරයෙන් අවබෝධ කර ගැනීමට ඉවහල් වන තවත් වැදගත් න්‍යායාත්මක සංකල්ප දෙකක් ලෙස පරිණාමය හා අනුවර්තනය හැඳින්විය හැකි ය.

(i) සංස්කෘතික පරිසර විද්‍යාව බැඳී පවතින්නේ කවර විෂයයන් සමග ද?
(ii) අර්ථකථනාත්මක පුරාවිද්‍යාවෙහි ප්‍රධාන න්‍යායාත්මක සංකල්පය ලෙස සැලකෙන්නේ කුමක් ද?
(iii) බොහෝ ශික්ෂණයන්හි ගමන් මග තීරණාත්මක ලෙස වෙනස් කිරීමට බලපෑ ගාමක බලවේග මොනවා ද?
(iv) පශ්චාත් සංස්ලේෂී පුරාවිද්‍යාව බිහිවන්නේ කවර විෂයයක ආභාසයෙන් ද?
(v) පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව අවබෝධ කර ගැනීමට ඉවහල් වන්නේ කවර සංකල්ප ද?

(ලකුණු 10 යි.)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

අධ්‍යාපනයෙහි ලා ඉතා වැදගත් මෙහෙයක් කෞතුකාගාරවලින් සිදු විය හැකි බව බොහෝ දෙනා පිළිගනිති. කෞතුකාගාර ප්‍රදර්ශන භාණ්ඩ, ඉගැන්වීමෙහි දී ඉතා ප්‍රයෝජනවත් උපකරණ වන අතර පන්තියෙහි දී උගන්වන විෂය කරුණු වඩාත් තහවුරු කිරීම සඳහා ගුරුවරුනට ඒවා භාවිත කළ හැකි ය. බොහෝ කෞතුකාගාර වැඩසටහන් විමසීමේ දී පාසල් ළමයින් සඳහා මේවායින් සිදු කළ හැකි සේවාව අප්‍රමාණ බව පැහැදිලි වේ. මේ වැඩසටහන්වල සාර්ථකභාවය සහ කාර්යසාධනයට හේතු වන සාධක ගණනාවක් ඇති බව ද සැලකිය යුතු ය. බාල පරපුරෙහි අනාගතය රැඳී ඇත්තේ ගුරුවරුන් අත හෙයින් ඔවුන් විසින් සමාජයට ඉමහත් සේවයක් ඉටු කරනු ලැබිය යුතු ය යන්න වර්තමානයේ පිළිගත් මතය යි. තමන් භාරයේ සිටින දරුවන් නැණසත්, හොඳ හැදීමෙන් යුත්, ප්‍රයෝජනවත් පුරවැසියන් බවට පත් කිරීමේ භාරදූර වගකීම ඔවුන් සතු ය. මෙම බරපතළ වගකීම පන්ති කාමරයෙහි ඉගැන්වීමෙන් පමණක් ඉටු කළ නොහැකි බැවින් පාසල් අධ්‍යාපන පටිපාටියට අතිරේක ව කෞතුකාගාරවලින් ගත හැකි ප්‍රයෝජන බෙහෙවින් අගය කෙරේ. නානා යුගවලට සහ දේශවලට අයත් වූ ද විවිධ අංශවලට අයත් වූ ද සත්‍ය වූ සහ ඉතා විශ්වාස කටයුතු වූ ද වස්තු කෞතුකාගාරවල දක්නට ඇත. මේවායින් බොහෝ වස්තු එරටෙහි වෙනත් තැනක දී දකින්නට වත් අධ්‍යයනය කරන්නට වත් පාසල් ළමයින්ට හෝ ගුරුවරුන්ට හෝ හැකිවෙතොත් ඒ කලාතුරකිනි.

(ලකුණු 15 යි.)

3. දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) සිංහල ගීතය පෝෂණයෙහි ලා ජන සාහිත්‍යයෙන් ලැබී ඇති ආභාසය
(ii) අදූරදර්ශී මානව ක්‍රියාකාරකම් හා ස්වාභාවික විපත්ති
(iii) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම හා අනාගත අභියෝග
(iv) ලාංකේය ශ්‍රම බලකායට යොවුන් ප්‍රජාව සම්බන්ධ කර ගැනීමේ ක්‍රමෝපාය
(v) රටක සංවර්ධනය කෙරෙහි සමබර වූ විදේශ ප්‍රතිපත්තියක අවශ්‍යතාව
(vi) ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්ෂේත්‍රය කෙරෙහි පෞද්ගලික විශ්වවිද්‍යාලයවල බලපෑම (ලකුණු 25 යි.)

4. (අ) පහත සඳහන් වාක්‍යවල **සදොස් තැන් ඇතොත් නිදොස් කොට** ලියන්න.

(i) දරුවෝ එහි යතත් අපි එහි නො යමු.
(ii) අපි ජයගනිමු'යි දේශපාලකයන් උදම් ඇනුහ.
(iii) ඈත දියෙහි පිහිනන තල්මසුන් අපට පෙනෙති.
(iv) මවුපියෝ යහපත් වෙත් නම් දරුවෝ ද යහපත් වෙති.
(v) අම්මා ද අක්කා ද මම ද එහි ගියෙමි. (ලකුණු 05 යි.)

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.

(i) ශිෂ්‍යයෝ මහාචාර්යතුමා පසසති.
(ii) දඩයක්කාරයෝ අභයභූමියට වැදී වනසතුන් දඩයම් කළහ.
(iii) නවකතාකරුවෝ විචාරකයන් හෙළා දකිති.
(iv) ව්‍යාපාරිකයෝ තම උත්සව සඳහා ගායකයන් ගෙන්වති.
(v) ඔවුහු අප මුළා කළහ. (ලකුණු 05 යි.)

(ඇ) **නිවැරදි වැකියක්** නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) දරු වියොවින් (ඔවුන්/ඔවුහු) හඬා වැලපෙති.
(ii) ස්තුති කථාවෙන් අනතුරුව (සභාව/සභාතොමෝ) විසිර ගියේ ය.
(iii) නාහිමියෝ (මිනිසුන්/මිනිස්සු) ලවා විහාර භූමිය පිළිසකර කරවති.
(iv) පියා විසින් (අප/අපි) රක්නා ලදුමු.
(v) (සොරුන්/සොරු) ආහ'යි ඔවුහු බිය වූහ. (ලකුණු 05 යි.)

5. (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල **අර්ථ විග්‍රහ කර** ලියන්න.

(i) ඔවුන්ට **ප්‍රවේණියෙන්** හිමි වූ වස්තුව බොහෝ ය.
(ii) සිංහල ජනශ්‍රැතියට **පුරාවෘත්ත** ද අයත් වෙයි.
(iii) සිංහලයා බටහිර සිරිත්-විරිත් **අන්ධානුකරණය** එවක ගත්කරුවන්ගේ උපහාසයට ලක් විය. (ලකුණු 03 යි.)

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් සුදුසු තනි පද** ලියන්න.

(i) මධ්‍ය කාලයට අයිති
(ii) වචනවල නිෂ්පත්තිය
(iii) කෙනකුගේ ඉරණම දැනගත් තැනැත්තා (ලකුණු 03 යි.)

(ඇ) පහත දැක්වෙන වාක්‍යවල **හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා** ලියන්න.

(i) පුද්ගල .............................. ගොඩනැඟීමට අධ්‍යාපනය ද ඉවහල් වෙයි.
(ii) යෞවන .............................. ඔප් නංවන බවට ඇමතිතුමා පොරොන්දු විය.
(iii) සෑම සංස්කෘතියකට ම .............................. අංග ද අත්‍යවශ්‍ය වේ.
(iv) පුද්ගලයා..................... බන්ධනයන් කෙරෙහි ගිජු වෙයි.
(v) ඒ ශිෂ්‍යයා..................... ඥානයෙන් යුක්ත ය.
(vi) පැරණි කවියා අලංකාර ..................... කිරීමෙහි ලා දක්ෂ ය.

( ලෞකික, ව්‍යවහාරික, කුසලතා, පෞරුෂය, භෞතික, භාවිත) (ලකුණු 03 යි.)

(ඈ) **තද කළු අකුරෙන්** දක්වා ඇති **බහු අර්ථ පදය යොද වෙනත් අරුතක් දෙන ලෙස** වාක්‍යය බැගින් තනන්න.

(i) ඔහු තනතුරකට **පත්** වෙයි.
(ii) **සඳ** මත පා තැබීම කළ නොහැකි දෙයක් බව ඇතැමුන්ගේ විශ්වාසය යි.
(iii) අයදුම්පතක මුලින් ම ලිවිය යුත්තේ තම **නම** යි.
(iv) **පුර** පොහොය සෑම මසක් පාසා ම උදා වෙයි.
(v) වැද්දා වැවෙන් මාළු **බා** වනයට යයි.
(vi) **දන** රැස් කිරීම කවුරුත් ප්‍රිය කරති. (ලකුණු 06 යි.)

[පස්වැනි පිටුව බලන්න

6. පහත දැක්වෙන වාක්‍යවල **තදකළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංශය** දක්වා ඇත. ඒවායෙහි **අශුද්ධතා** දක්වන්න.

(i) සතතුරු පිටුපස **ලුහුබඳින** මිනිස්සු ඇතැම් විට **සාපරාධ** ක්‍රියාවල ද නිරත වෙති. (**බඳින** - කෘදන්ත, **සාපරාධ** - තද්ධිත, **ද** - නිපාත)

(ii) **බමුණාගේ සූර්යෝදයට** පෙර **ගංගානදියෙහි** ජලස්නානය කළහ. (**බමුණාගේ** - තද්ධිත, **සූර්යෝදය** - සන්ධි, **ගංගානදිය** - සමාස)

(iii) **සුනිල්** දියදහර මත සුපිපි **සුදුනෙළුම්** පරිසරය **දුනාවත්** කළේ ය. (**සුනිල්** - උපසර්ග, **සුදුනෙළුම්** - සමාස, **දුනාවත්** - තද්ධිත)

(iv) දරුවා **ගසින්** ගෙඩියක් කඩා, **පිහියෙන්** එය **කපමින්** මුවගට සිනා නැගී ය. (**ගසින්** - විභක්ති, **පිහියෙන්** - විභක්ති, **කපමින්** - ක්‍රියා)

(v) **දෙසබසරැස** නායකු වස් මහමෙහෙයක් **කළ කුමරතුගුවෝ** පෙළහැවුල ඇරඹූහ. (**දෙසබසරැස** - සමාස, **කළ** - කෘදන්ත, **කුමරතුගුවෝ** - විභක්ති)

(ලකුණු 15 යි.)

7. (අ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් ගැළපෙන** ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) කථාවේ ප්‍රමාණයට ක්‍රියාව නැත

(ii) කිසිම විදිහකින් නිදහසක් නැති වීම

(iii) උගතා කලබල නොවෙයි

(iv) ආපසු නොඑන පුද්ගලයා අලාභ කොට යැම

(v) නොසිතූ අන්දමේ ප්‍රතිඵලයක් ලැබීම

(vi) පමණ දැන කටයුතු කිරීම

(ලකුණු 03 යි.)

(ආ) පහත දී ඇති **රූඪිවල අදහස පැහැදිලි වන සේ** වාක්‍යවල යොදන්න.

(i) හතර බීරි කථාව (ii) නිකිණි පෙවීම

(iii) බත තපස් රැකීම (iv) තෝන් ලණුව දා ගැනීම

(v) ඇගේ මාළු නටනවා (vi) වහ කදුරු කැවීම

(ලකුණු 03 යි.)

(ඇ) පහත දී ඇති **එක් එක් යුගල පද හැදී ඇති රටාව** කුමක් දැයි දක්වන්න.

(i) ආවාහ - විවාහ (ii) අක්කා - නගෝ

(iii) මහත - දෙමහත (iv) දරු - මල්ලෝ

[illegible]

(ඈ) පහත දී ඇති **ප්‍රාදේශීය ව්‍යවහාර සඳහා පොදු ගාවිතයේ යෙදෙන පද** ලියා දක්වන්න.

(i) ගහමච්චා (ii) ඔයනවා

(iii) හොයනවා (iv) වැහි බිත්තර

(v) නැම්ම (vi) මන්ඩාරම

(ලකුණු 03 යි.)

(ඉ) පහත දී ඇති **ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු ගාවිතයේ යෙදෙන අරුත්** ලියන්න.

(i) කමත අඹනවා (ii) ඇඹයා

(iii) දිස්ටිය (iv) අම්බුලි මාමා

(v) උද්දෙරි (vi) කරවාඩය

(ලකුණු 03 යි.)

8. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අහෝප්‍රියයාණනිඔබමාදක්නටපැමිණියේසාරමසකටපසුවයිස්වාමීනිඔබනොමැතිවගෙවීගියශිශිරසෘතුවමටග්‍රීෂ්මයක්මවිය
දැන්වසන්තසෘතුවපැමිණඇතකෝකිලයෝකූජනයකරතිමයූරයෝකේකාධ්වනිපවත්වතිමුළුපරිසරයම
සශ්‍රීකත්වයෙන්බරවඇතමෙවරනම්මාඅතැරනොයනුමැනවපෙම්බරාණනිමාප්‍රේමියනිමටසමාවුවමැනවඅපගේ
පෞද්ගලිකසුඛවිහරණයටවඩාජාතියේආරක්ෂාවදේශයේඅභිමානයමෙන්මවංශපරම්පරාවේප්‍රෞඪත්වයප්‍රමුඛත්ව
යෙහිලාසැලකියයුතුයපරසතුරන්ගෙන්රටගලවාගැනීමේකාර්යයෙහිවහාවහාතවපිටිනබැවින්සේනාසංවිධානය
වමුල්තැනදීමටසිදුවියඒකෙසේවුවත්මාහෙටනැවතසටන්බිමටයායුතුයඑසේනම්ප්‍රියයදියනාමාමෙසැකසූරඑභෝජනය
අනුභවකොටමල්පහන්ගෙනවහවහාඅපිඅසුරුමුනිවිහාරයටයමුමටඔබසමඟඑහිදීකළයුතුමන්ත්‍රණයක්ඇතස්වාමිනිඅපිවි
හාරයවැඳදියපොකුණඅබියසළදහානයටයමුමාප්‍රියසුභදාණනිමානිවසෙහිදිවිගෙවනුයේහුදකලාවමියඔබගේනැගු
යෝදමටනොයෙකුත්ඇනුම්පදකියතිවදඑකියකැයිනිග්‍රහදකරතිඅනේමාප්‍රියයමටඔබවැනිමවූපුත්රුවනකලබාදෙන්නැයිඅ
ඔහුගේඇසයේවාඩිවීපපුතුරටහිසතබාකනටසෙමින්මිමිණුවායප්‍රේමියමම්ඵයතුටුකරන්නෙමියිඔහුදඇයදැඩිවනමළයටසමීප
කරගත්තේය

(i) **ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ වචන වෙන් කොට, අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත** ලියන්න.

(ii) **කාර්යය, ප්‍රාර්ථනා** යන වචන රේඵය යොදා නැවත ලියන්න.

(iii) '**පුද්ගල + ඉක** - පෞද්ගලික නම් **ගුණ + ඉක**' කෙසේ සකස් වේ ද?

(iv) '**ද්‍රෝණ**' යන්නෙහි ස්වර හා ව්‍යඤ්ජන වෙන් කර ලියන්න.

(v) '**කණ්ඨජ, අඝෝෂ, මහාප්‍රාණයක්**' සහිත වචනයක් ඡේදයෙන් උපුටා දක්වන්න.

(ලකුණු 15 යි.)

* * *